# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

### 2022 නොවැම්බර් - 2023 ජනවාරි

### සමාජීය විද්‍යා පීඨය

### භූගෝල විද්‍යාව (නව නිර්දේශය)

### ශ්‍රී ලංකාවේ භූගෝල විද්‍යාව **GEOG – E 3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.      කාලය : පැය 03 යි.

---

01. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ සහ නිරපේක්ෂ පිහිටීම එහි සංස්කෘතික භූ දර්ශනයේ විවිධත්වයට පදනම් වූ ආකාරය විමර්ශනය කරන්න. (ලකුණු 20)

02. ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනයේ සැකැස්ම පිළිබඳ ෆ්‍රෑන්ක් ඩෝසන් ඇඩම්ස් (1929) ඉදිරිපත් කළ අදහස් සහ එයට විකල්ප වශයෙන් ඉදිරිපත් වූ මතවාද සමාලෝචනය කරන්න. (ලකුණු 20)

03. මෝසම් ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කෙරෙහි බලපාන ආකාරය උදාහරණ මගින් පරීක්ෂා කරන්න. (ලකුණු 20)

04. ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනයේ නව ප්‍රවණතා සහ අභියෝග පිළිබඳ භූගෝල විද්‍යාත්මක සාකච්ඡාවක යෙදෙන්න. (ලකුණු 20)

05. ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ඍතුමය ජල හිඟය තුලනය කරමින් ගොවිජන ජීවිතය සුරක්ෂිත කිරීමට එල්ලංගා වැව් පද්ධතිවල දායකත්වය පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 20)

06. මිනිස්-පරිසර සබඳතාවල තුල්‍යතාව බිඳවැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් උත්සන්න වී ඇති වන සත්ත්ව ආක්‍රමණ දේශීය ආහාර නිෂ්පාදනයට සිදුකරන බලපෑම සහේතුකව නිරීක්ෂණය කරන්න. (ලකුණු 20)

07. "ප්‍රමාණයෙන් කුඩා දිවයිනක් ලෙස හැඳින්වුවද ලෝක බල අරගලයේ දී ශ්‍රී ලංකාවේ භූ දේශපාලනමය වැදගත්කම ඉතා විශාලය." මෙම ප්‍රකාශය විවරණය කරන්න. (ලකුණු 20)

08. ශ්‍රී ලංකාව රටක් වශයෙන් වර්තමානයේ මුහුණ දෙන ජන ජීවිතයේ සංකීර්ණ බිඳවැටීමට පසුබිම් වූ සාධක පිළිබඳ ඔබගේ අදහස් භූගෝල විද්‍යාව අධ්‍යයනය කරන විද්‍යාර්ථියෙකු ලෙස විවේචනාත්මකව ඉදිරිපත් කරන්න. (ලකුණු 20)

****************************